පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
සති පාසල් වැඩසටහන

විෂයය: නාට්‍ය හා රංග කලාව

සතිය - 3

13 ශ්‍රේණිය

සැකසීම-පුබුදි බාලසූරිය

## කාර්ය පත්‍රිකාව 3

**නිපුණතාව 01** : **කලාව යන්න විමසමින් නාට්‍ය හා රංග කලාව අනෙකුත් කලා සමග සංසන්දනය කරයි.**

**නිපුණතා මට්ටම** : **නාට්‍ය හා රංග කලාව සමග බැඳි පාරිභාෂික යෙදුම්වල අර්ථ නිරූපණය කරයි.**

**ක්‍රියාකාරකම්** : **නාට්‍ය අධ්‍යක්ෂවරයාගේ කාර්ය භාර්ය හඳුනා ගනී. ( 1. 1. 1 )**

- **නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

(01). නාට්‍ය දර්ශනයක් සඳහා අධ්‍යක්ෂ විසින් තම කාර්යන් ප්‍රධාන වශයෙන් පවරන්නේ
i. රංගභූමි පාලකවරයාටය ii. ප්‍රධාන නිළියටය iii. ගායක කණ්ඩායමටය
iv. අංග රචනා ශිල්පියාටය v. ප්‍රධාන නළුවාට

(02). නාට්‍ය රචනයක්, අධ්‍යක්ෂණයත් භාරව වෙන වෙනම ප්‍රවීනයන් සිටි සම්ප්‍රදාය වන්නේ,
i. ග්‍රීක නාට්‍යය ii. සංස්කෘත නාට්‍ය iii. මධ්‍ය කාලීන නාට්‍ය
iv. නෝ නාට්‍ය v. එළිසබතීන නාට්‍ය

(03). නාට්‍ය අධ්‍යක්ෂවරයාගේ කාර්ය භාර්ය සම්බන්ධ වඩාත් නිවැරදි ප්‍රකාශය වන්නේ,
i. නාට්‍ය පෙළ රචනය
ii. නාට්‍යයේ අර්ථපති ලෙස කටයුතු කිරීම
iii. නාට්‍ය පෙළ සජීවී කලා මාධ්‍යයක් ලෙස වේදිකාව මත අභිනිර්මාණය කිරීම.
iv. රංගභූමි අලංකරණය පරීක්ෂා කිරීම
v. නාට්‍ය නිෂ්පදනය පිළිබඳ මූලික වගකීමෙන් බැහැර වීම.

(04). සොඳුරු ආඥාදායකයා වශයෙන් නාට්‍ය අධ්‍යක්ෂවරයා හඳුන්වන ලද්දේ,
i. ජයලත් මනෝරත්න විසිනි ii. සයිමන් නවගත්තේගම විසිනි
iii. සුගතපාල ද සිල්වා විසිනි iv. හෙන්රි ජයසේන විසිනි
v. සෝමලතා සුභසිංහ විසිනි

### II - කොටස

- **සියලු ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

(01). නාට්‍යයක් සාර්ථක වීමට නළුවරණයේ ඇති වැදගත්කම සාකච්ඡා කරන්න.

(02). නළුවරණයේදී අධ්‍යක්ෂකවරයා මුහුණ පාන ගැටළු හා අභියෝග පිළිබඳ විමසන්න.

(03). නාට්‍ය රචකයා හා අධ්‍යක්ෂකවරයා දෙනෙකු වීම නාට්‍ය නිෂ්පාදනයේ සාර්ථකත්වයට කෙසේ බලපායිදැයි ඔබේ අදහස් දක්වන්න.